පස්ගොඩ ප්‍රාදේශීය සභාව,
මාතර දිස්ත්‍රික්කය.
-------------------

## 1. මූල්‍ය ප්‍රකාශන
---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 08 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 15 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
----------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------

#### (අ) ගිණුම්කරණ අඩුපාඩු
----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------- | ----------------- |
| (i) | ඌරුබොක්ක ක්‍රීඩාංගණයේ ජල ව්‍යාපෘතිය ඉදිකිරීමේ කර්මාන්තයට ගෙවිය යුතු වියදමට වඩා රු.102,427 ක් වැඩිපුර ප්‍රතිපාදන වෙන් කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණයගැතියන් සඳහා රු.56,828 ක් වැඩියෙන් ප්‍රතිපාදන සලසා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.289,641 ක උපකරණ ගිණුම් ගතකර නොතිබුණි. | සියළු ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | ඉදිරි වර්ෂය සඳහා ටෙන්ඩර් කිරීමට අදාළ රු.219,717 ක වියදම සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) **නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.7,687,969 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛන අනුව දැක්වෙන ශේෂ අතර අසමානතා එකතුව රු.114,369 ක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.1,515,535 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්‍ෂා කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 178 (7) (2) | නියැදි පරික්ෂාවට අනුව රු.365,150ක වටිනාකමින් යුක්ත ජල ටැංකි සහ වීථි පහන් කට්ටල හා උපකරණ මිලදී ගැනීමේදී රහස්‍යභාවය රැකෙන පරිදි මිල ගණන් ලබා ගෙන නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ටෙන්ඩර් පෙට්ටියට යොමු කර රහස්‍ය භාවය රැකෙන පරිදි මිල ගණන් ලබා ගෙන මිල දී ගැනීම් කටයුතු සිදු කරමි. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2. ඡේදය | කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමට සුදුසුකම් කැඳවීමේදී දින 14 ක කාලයක් පමණක් ලබාදී තිබුණි. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියට කටයුතු කිරීමේදී නිසි ආකාරයට දින 21 ක කාලයක් ලබා දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුව පුවත්පත් දැන්වීම් පල කිරීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1646 | සමාලෝචිත වර්ෂයේ අවසන් කාර්තුවට අදාලව සභාව සතු වාහන 06 ක හා යන්ත්‍රෝපකරණ 03 ක දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,881,782 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,677,599 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තු ආදායම්, බිල් කළ ආදායම, රැස් කළ ආදායම හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,037,500 | 1,682,285 | 1,678,593 | 99,784 | 1,712,000 | 1,673,275 | 1,674,580 | 96,092 |
| කුලී | 11,209,000 | 7,938,843 | 10,715,776 | 520,648 | 9,051,000 | 8,206,041 | 9,473,731 | 3,297,581 |
| බලපත්‍ර ගාස්තු | 1,738,200 | 1,377,973 | 1,377,973 | - | 584,650 | 755,167 | 755,167 | - |
| වෙනත් ආදායම් | 15,493,500 | 14,046,755 | 13,143,280 | 17,794,718 | 11,038,000 | 13,492,590 | 12,765,789 | 16,891,243 |
| **එකතුව** | 30,478,200 | 25,045,856 | 26,915,622 | 18,415,150 | 22,385,650 | 24,127,073 | 24,669,267 | 20,284,916 |

### 2.2.2 අක්කර බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ආරම්භක හිඟය රු.96,092 ක් වූ අතර, රු.25,325 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.121,417 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු. 21,632 ක් වීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට රු.99,785 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිග අක්කර බදු මුදල් සහ වර්ෂයට අදාළ අක්කර බදු මුදල් අය ගැනීම සඳහා අක්කර බදු හිමියන්ට ලිපි මගින් දැනුවත් කර තිබුණි.. |

### 2.2.3 පොළ බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ආරම්භක හිඟය රු.211,488 ක් වූ අතර, රු.5,606,123 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.5,817,611 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.5,606,123 ක් වීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට රු.211.488 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | මේ සම්බන්ධයෙන් නීතිමය කටයුතු ආරම්භ කර තිබුණි. |

### 2.2.4 වෙනත් ආදායම්

**උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට උසාවි දඩ වෙනුවෙන් රු.1,486,642 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.15,461,870 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුවේ. | මුදල් ගෙන්වා ගැනීම සඳහා පළාත් සභාවේ ප්‍රධාන ලේකම් මගින් ඉල්ලීම් කර ඇති නමුත් ක්‍රමවත් පරිදි ප්‍රතිපූර්ණය වීම සිදුවී නොතිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් දායක මුදලට ගෙවිය යුතු රු. 1,920,720 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | නිවැරදි තොරතුරු සනාථ කර ගැනීමෙන් පසු විශ්‍රාම වැටුප් දායක මුදල ගෙවීමට කටයුතු කරමි. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව සභාව සතු අතිරික්ත මුදල් ස්ථාවර තැන්පතුවක යෙදිය හැකි වුවද සමාලෝචිත වර්ෂයේ අයවැය මගින් ප්‍රතිපාදන සලසා තිබූ රු. 63,000,000 ක ව්‍යාපෘති 05 ක් ක්‍රියාත්මක නොකර සමාලෝචිත වර්ෂයේ බැංකුගත කරන ලද රු.5,000,000ක මුදල ඇතුලත්ව රු.45,243,062ක ස්ථාවර තැන්පත් ශේෂයක් සභාව විසින් පවත්වාගෙන ගොස් තිබුණි. | ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුවේ. | සභා දේපල සංවර්ධනය කිරීම්වල පැවති ගැටළු සහගත තත්ත්වය හේතුවෙන් ප්‍රතිපාදන වෙන් කර තිබූ ඉදිකිරීම්වල වැඩ ආරම්භ කර නොතිබුණි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී මාර්ග සංවර්ධන සහ ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා රු.40,689 ක වියදමක් දරා සුදුසුකම් පරීක්ෂා කිරීමට දැන්වීම් පළකර, ඇගයීම් කමිටුවක් මගින් සුදුසුකම් ලත් කොන්ත්‍රාත්කරුවන් 06 දෙනෙකු තෝරාගෙන තිබූ නමුත් රු.45,038,163 ක් ඇස්තමේන්තු වටිනාකමින් යුක්ත සංවර්ධන ව්‍යාපෘති 92 න් කීපයක් අනුමත සමිතිවලට පවරා තිබූ අතර ඉතිරි ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි. | තෝරාගත් කොන්ත්‍රාත්කරුවන් සඳහා කොන්ත්‍රාත් පිරිනැමිය යුතුවේ. | ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කර තිබූ බැවින් යෝජනා ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම නිසා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ යෝජනා කිසිවක් ක්‍රියාත්මක කර නොතිබුණි. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| | අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 20 ක් සම්පූර්ණ කර ගැනීමටත්, එක් අතිරික්ත සේවකයෙකු විධිමත් කර ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කරගැනීම හා පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුවේ. | ද්විතීයික තනතුරේ පුරප්පාඩු තුළ පැවති සංවර්ධන නිලධාරී තනතුරු 02 මේ වන විට සම්පූර්ණ වී ඇත. ප්‍රාථමික තනතුරේ පුරප්පාඩු 18 සඳහා විධිමත් ලෙස බඳවා ගැනීමට අනුමැතිය ලබා ගත් අතර |

| | | |
|---|---|---|
| | | සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 27 දින පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් ලැබුණු අංක 01/06/01 දරණ ලිපියට අනුව සියළු බදවා ගැනීම් නැවත දැනුම් දෙන තුරු තාවකාලිකව අත්හිටු වූ බවට දන්වා සිටිමි. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පරිසර බලපත්‍ර ලබා නොගත් ආයතන 43 කින් පරිසරයට වන හානිය පිළිබඳව සභාවේ අවධානය යොමුවී නොතිබුණි. තවද ඒ වෙනුවෙන් පෙරසැරි ගාස්තු හා පරිසර බලපත්‍ර ගාස්තු වශයෙන් රු.301,000 ක් අයවී නොතිබුණි. | සුදුසුකම් පරීක්ෂා කර කඩිනමින් පරිසර බලපත්‍ර ලබාදීමට කටයුතු කළ යුතුවේ. | පරිසර බලපත්‍ර ලබා දීම සඳහා අවශ්‍ය කරන සුදුසුකම් සපුරාලීමෙන් පසුව පරිසර බලපත්‍රය ලබා දීමට කටයුතු කරමි. |

**3.4 ප්‍රසම්පාදනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සභා බල ප්‍රදේශයේ දැන්වීම් පුවරු සවි කිරීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත රු.1,480,795 ක් ගෙවා තිබුණද පිරිවිතර, ඇස්තමේන්තු, තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා සහ සවි කරන ලද දැන්වීම් පුවරු නියමිත ප්‍රමිතියට සවිකර ඇති බවට කාර්මික නිලධාරී වාර්තා ලබා ගෙන නොතිබුණි. | සියළු දැන්වීම් පුවරු සවි කිරීමේදී කාර්මික නිලධාරී වාර්තා ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ සකස් කළ දැන්වීම් පුවරු සඳහා බිල්පත් ඉදිරිපත් කිරීමෙන් පසුව තාක්ෂණ සේවා නිලධාරී විසින් පරීක්ෂා කර බලා වාර්තා කිරීමෙන් පසුව ගෙවීම් කටයුතු සිදු කරමි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයන් සිදු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 වසර තුළ අභ්‍යන්තර විගණන කටයුතු තවදුරටත් කාර්යක්ෂමව සිදු කරමින් වාර්තා ජාතික විගණන උප කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |